**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2021.12.29**

**පළාත් ඉංජිනේරු කාර්යාංශය**

2021 වර්ෂයේ IV කාර්තු තුල පැවැත්වූ II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2021.12.29 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත ඉදිරිපත් කරමි.

2021.12.29 වන දින ප.ව.2.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. ජී.ඩබ්.පී.පෙරේරා මියගේ ප්‍රධානත්වයෙන් සහ එතුමිය විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**සහභාගී වූ නිලධාරීන්**

01. ජී.ඩබ්.පී.පෙරේරා මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. - පළාත් ඉංජිනේරු කාර්යාංශය
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාලය
04. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය.
05. එස්.ඒ.ඩී.පී.ප්‍රියදර්ශනි මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
06. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
08. ආර්.ඒ..විජයප්‍රිය මයා - ඉංජිනේරු නිර්මිත - පළාත් ඉංජිනේරු කාර්යාංශය
09. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී -පළාත් ඉංජිනේරු කාර්යාංශය
10. ඩබ්.ජී.අරලිය මධුශානි මිය - අභ්‍යන්තර විගණක III - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
11. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
13. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.

1. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
2. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
3. එග්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර
4. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ
5. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම
6. එස්.ඩි.සේනාරත්න මිය- ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන
7. ආර්.එම්.ඒ.එස්.සකුන්තලා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ
8. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම
9. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම
10. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල
11. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල (වැ.බ.)
12. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය/වගකීම |
|---|---|---|---|
| 1.1 | (I) පළාත් සහා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම WNP/CB/R/CS/2020/AQ/10 හා 2020.02.28 | මෙම විගණන විමසුම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් කැඳවා ඇති බවත්, එම පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් තමන්ටද සෑහීමකට පත්විය නොහැකි බවත්, නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) පවසන ලදි.<br><br>වේලා පාලන පද්ධතියක් සපයා සවිකිරීම් කොන්ත්‍රාත් සැපයුමට අදාලව තාක්ෂණික දෝෂ පවත්න්නේද යන්න සොයා බලා රඳවුම් මුදල් තාක්ෂණ දෝෂයක් නොමැති නම් අදාල නිර්දේශයක් ලබාගෙන ගෙවීම සම්බන්ධයෙන් විගනකාධිපතිගේ විරුද්ධත්වයක් නොමැති බවත්, මෙහි පවතින්නේ මිලදී ගැනීමේ දෝෂයක් බවත් විගණන අධිකාරි පෙන්වා දෙන ලදි. | මේ වන විට මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කර ඇති බවත්, ඊට අදාලව පිළිතුරු සැපයීම සඳහා අදාල පැහැදිලි කිරීම් සකස්කර ගන්නා ලෙස විගණන අධිකාරි ප්‍රකාශ කරන ලදි |
| | (11) හෝමාගම ඉංජිනේරු කාර්යාලයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අදාල විගණන විමසුම | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල විශාල වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලින් සිදුවන බැවින් මේ සම්බන්ධයෙන් පුහුණු කිරීම් සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු සැලසුම් කරන බව නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) පවසන ලදි.<br>මෙම වසරේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මේ වන විට කාර්යාල 07 ක් පරීක්ෂාකර ඇති බවත් අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදි.<br>මින් විගණන විමසුම් 5 කට පිළිතුරු ඉදිරිපත් කර ඇති බවත් අතුරු විමසුම් 2 කට හා විගණන විමසුම් 2 පිළිතුරු ඉදිරිපත් කිරීමට ඇති බවත් ප්‍රධාන ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. | නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) |
| 1.2 | (11) නව පළාත් සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු සඳහා පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව | පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා ද ඇති අත්තිකාරම් මුදලින් 2021 අප්‍රේල් මාසයෙන් පසුවද විශාල මුදලක් එහි ගිණුමේ ඉතිරිව ඇති බවත් මේ සම්බන්ධයෙන් පසු විපරම් සිදු කරන ලෙසත් විගණන අධිකාරි පවසන ලදි.<br><br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉතිරිව ඇත්තේ රඳවුම් මුදල් බව මුලස්ථාන ඉංජිනේරු පැහැදිලි කරනලදි.<br><br>තවදුරටත් ගෙවීමට ඇති තැන්පතු මුදල් සම්බන්ධයෙන් ලේඛනයක් විගණන අධිකාරි වෙත ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) /ප්‍රධාන ගණකාධිකාරි/ මුලස්ථාන ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 1.3 | ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරිමේදි ව්‍යාපෘති වාර්තාවක් ලබා ගැනීමේ වැදගත්කම අභ්‍යන්තර විගණන අංශයෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘති සඳහා මුදල් වෙන්කිරිම සිදු කරන්නේ සැලසුම් අංශය විසින් බවත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම ඉංජිනේරු කාර්යාංශයෙන් සිදු කර බවත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු ) පැහැදිලි කරන ලදි. මිල ගණන් කැඳවිමේදි සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහාම මිළ ගණන් කැඳවිමට කටයුතු සිදු කරන බවත්, ඉදිකිරිම් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව සිදු කරන බවත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු ) පෙන්වා දෙන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 2.1 | "Complain Management" විගණන විමසුම අංක: WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | මෙම පරිගණක මෘදුකාංගය මෙවන විට භාවිතයට ගැනීම සිදු වන බවත් දිනපතා ලැබෙන ඉල්ලීම් පරික්ෂාකර ඊට අදාල ඉදිරි කටයුතු සිදු කරන බවත්, මෙම මෘදුකාංගය යාවත් කාලීනව කරගෙන යන බවත් මුලස්ථාන ඉංජිනේරු පවසන ලදි.<br><br>නමුත් බොහෝ ආයතන මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් දැනුවත්ව නොමැති බව විගණන අධිකාරි ප්‍රකාශ කරන ලද අතර මෙහිදි සිදුව ඇත්තේ, මේ පිළිබඳව දැනුවත්ව සිටි නිලධාරින් ස්ථාන මාරුවි ගියද අලුතින් පැමිණි නිලධාරින් මෙම මෘදුකාංගය මඟින් පැමිණිලි ඉදිරිපත් කිරිමට නොදන්නා බව මුලස්ථාන ඉංජිනේරු විසින් පවසන ලදි.<br><br>මෙම මාදුකාංශය භාවිතා කිරිම සම්බන්ධයෙන් 2022 පළමු කාර්තුව තුල ITRDA ආයතනය සමඟ සම්බන්ධ වී ආයතනයකින් නිලධාරින් දෙදෙනෙකු බැගින් කැඳවා පුහුණුවක් දිමට තිරණය විය. | මුලස්ථාන ඉංජිනේරු |
| 2.2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් | ප්‍රධාන කාර්යාලයේ 6 මාසය ඉක්මවූ චෙක්පත් මේ වන විට නිරවුල් කර ඇති බව ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. බත්තරමුල්ල, කොළඹ, බියගම හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ද නිරවුල් නොවූ චෙක්පත් දෙසැම්බර් මාසයෙන් නිරවුල් කිරිමට ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය ඉංජිනේරුවරු දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 2.3 | හානි පාඩු සම්බන්ධව | 2012 වර්ෂයේ සිට අනතුරු 27 ක වාර්තා වි ඇති බවත් මින් තවදුරටත් රු.ලක්ෂ 21 අයවිමට ඇති බවත් විගණන අධිකාරි සඳහන් කරන ලදි.<br>මේ වන විට වෙනම කාර්ය මණ්ඩලයක් යොදවා වාහන අනතුරු සම්බන්ධ කටයුතු සිදු කරමින් පවතින බවත් ඉන් කොටසක් මේ වන විට අවසන් බවත් අනෙකුත් අනතුරු සම්බන්ධ කටයුතු මාර්තු මස වන විට අවසන් කිරිමට කටයුතු කරන බවත්, වැඩ අවසන් නොවූ අනතුරු 2020 පෙර අනතුරු බවත්, 2020 වර්ෂයට අදාලව නිම කිරිමට අනතුරු නොමැති බවත් පරිපාලන නිලධාරි විසින් පහැදිලි කරන ලදි. | පරිපාලන නිලධාරි |

| | | | |
|---|---|---|---|
| | | 2018 හා 2019 වර්ෂවල වාහන අනතුරු දැනට කාලාවරෝධි ව ඇති බවත් එම නිසි මේ සම්බන්ධ ගොනු පරීක්ෂාකර බලා පොත්වලින් කපාහැරීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) පැහැදිලි කරන ලද අතර කපා හැරීම රු.300,000/- ට වැඩි නම් කමිටු සභාපති ලෙස මාණ්ඩලික නිලධාරියකු පත් කළ යුතු බවද දැනුවත් කරන ලදි.<br><br>මෙම අනතුරු සම්බන්ධයෙන්ද හැකි ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස විගණන අධිකාරි උපදෙස් දෙන ලදි. | |
| 2.4 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම. | මේ වන විට විදේශ දූත සේවයට ගිය නිලධාරිනියකගෙන් මාසිකව ණය ශේෂ අයවන බවත්, ප්‍රවර්තන වර්ෂයේදි ස්ථානමාරු වී ගිය ස්ථාන මාරු වී පැමිණි හා විශ්‍රාම ගිය ණය ශේෂ පිළිබඳව කටයුතු යාවත්කාලින සිදු කරන බවත්, වැඩ තහනම්කර ඇති නිලධාරින් දෙදෙනාගෙන් ණය අයකර ගැනීමට නීති නිලධාරි වෙත යොමු කර ඉදිරි කටයුතු සිදු කරන බවත් ප්‍රධාන ගණකාධිකාරි හා ගණකාධිකාරි පැහැදිලි කරන ලදි.<br><br>පාලන ගිණුම හා කේවල ශේෂ අතර වෙනසක් පවතින බව විගණන අධිකාරි සඳහන් කරන ලදි.<br><br>එයට හේතුවවී ඇත්තේ ණය ශේෂය අයවී ඇතත් ණය ලේජරයෙන් එම අයවීම අඩුකර පෙන්වා නොතිබීම බවත් මේ සඳහා ජනල් සටහන් යොදා එය නිවැරදි කිරීමට මේ වන විටත් කටයුතු කර ඇති බවත් ප්‍රධාන ගණකාධිකාරි හා ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |
| 2.5 | කල් ඉකුත්වූ තැන්පතු | රැඳවුම් මුදල් ආපසු ගෙවීම සඳහා මේ වන විට රු.මි.46 ක ශේෂ පවතින බව විගණන අධිකාරි පවසන ලදි.<br><br>මෙයින් වැඩි මුදලක් ළහම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතියට අදාලවන බවත්, අදාළ ව්‍යාපෘති නිමවූ විගස එම මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බවත් ගණකාධිකාරි පැහැදිලි කරන ලදී.<br><br>පවතින තැන්පත් හැකි තරම් ආදායමට දැමීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම ) පැහැදිලි කරන ලදි.<br><br>2021.12.31 දක්වා තැන්පතු ලේඛනය 2022.01.31 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශිය ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 2.6 | පොදු ආකෘති පත්‍ර කමිටු වාර්තාව | නව ආකෘති පත්‍ර කිහිපයක් සැකසීමට සිදුවීමත්, ආකෘති පත්‍ර කිහිපයක නැවත නිවැරදි කිරීමට සිදු වූ බවත් සතියකින් පමණ අදාල කටයුතු නිමකර දිය හැකි බවත්, ගොඩනැගිලි අධ්‍යක්‍ෂ පවසන ලදි. කටයුතු නිම කිරීමෙන් පසු එම ආකෘති පත්‍ර කට්ටල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත යොමු කිරීමටත් එම කට්ටල 2 ක් විගණන අධිකාරි හා අභ්‍යන්තර විගණන අංශයට යැවීමටත් තීරණය විය. | ගොඩනැගිලි අධ්‍යක්‍ෂ/ පරිපාලන නිලධාරි |
| 2.7 | වාහන අනතුරු සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම | හානිපාඩු සම්බන්ධ ගොනු සමග මෙම වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතින බව පරිපාලන නිලධාරි පැහැදිලි කරන ලදි | පරිපාලන නිලධාරි |
| 2.8 | මීගමුව ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල ඉඩම | මීගමුව ධීවර සමිතිය එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සම්බන්ධයෙන් මේ වන විට ප්‍රාදේශීය ලේකම් විසින් විරෝධතා කැඳවා ඇති බව පරිපාලන නිලධාරි පැහැදිලි කරන ලදි.<br><br>අවිස්සාවේල්ල ඉඩම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් නිරීක්‍ෂණ විමසා යවා ඇති බවත් මේ දක්වා පිළිතුරු ලැබී නොමැති බවත්, පරිපාලන නිලධාරි පැහැදිලි කරන ලදි.<br><br>මෙම ඉඩමේ අයිතිය පිලිබඳව නීති නිලධාරි වෙත යොමු කර අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට තීරණ විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) /<br><br>ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පරිපාලන නිලධාරි |
| 2.9 | බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | මේ වර්ෂයට හා ලබන වර්ෂයට මුදල් නොමැති බැවින් ගොඩනැගිල්ල ඉදිකිරීම සිදු කිරීමට හැකියාවක් නොමැති බවත් අළුත්වැඩියාවක් පමණක් සිදු කළබවත් නි.ප්‍ර.ලේ (ඉංජිනේරු) පැහැදිලි කරන ලදි. | ගොඩනැගිලි අධ්‍යක්ෂ / බියගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.10 | පුහුණු කටයුතු | පුහුණු කටයුතු Zoom තාක්‍ෂණය හරහා සිදු කිරීමට තිරිණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 2.11 | 2019 වාර්ෂික ගිණුමේ ඇතුලත් අඩුපාඩු<br><br>අක්මුදල් ගැලපුම් ගිණුමක් පිලියෙල කර නොතිබීම<br><br>ස්ථාවරවත්කම් ලේඛණය පිලියෙල කර නොතිබීම | 2020 අවසන් ගිණුම් සමග අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කර ඇති බවත්,<br><br>2021 ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ඇති බවත් ගණකාධිකාරී විසින් දන්වන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි |

| | | | |
|---|---|---|---|
| 3.1 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මේ වන විට මෙම මෘදුකාංග පද්ධතිය අදාල දත්ත ස්කෑන් කර පද්ධතියට ඇතුලත් කිරිම මේවන විට සිදුකර ඇති බවත්, එම කොටස ITRDA ආයතනය වෙත බාරදී ඇති බවත් මේ සම්බන්ධයෙන් ආයතන අංශයට පුහුණුවක් ලබා දී ඇති බවත්, මෙම පුහුණුව ලබා දෙන්නේ මෘදුකාංග පද්ධතිය සකසන ආයතනයෙන් බවත්, එම දත්ත උපයෝගි කරගෙන ඉදිරි කටයුතු කිරිම තවදුරටත් සිදු කිරිමට ඇති බවත්, මෙය ලබන වසරේ පළමු කාර්තුව තුල නිම කිරිමට කටයුතු කරන බවත් ඉංජිනේරු (නිර්මිත) හා නි.ප්‍ර.ලේ .(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි.<br><br>මෙහි කටයුතු පළමු කාර්තුව තුල අවසන් කිරිමට උත්සහ කරන ලෙසත්, මේ සම්බන්ධ පුහුණුව දීමේදි විගණන නිලධාරින්ටද කැඳවිමක් කරන ලෙසද අධ්‍යක්‍ෂ (ගිණුම් හා ගෙවිම්) ප්‍රකාශ කරන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්‍ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්‍ෂ/ ඉංජිනේරු නිර්මිත ආර්.ඒ.විජයප්‍රිය මයා<br><br>ගොඩනැගිලි අධ්‍යක්‍ෂ / ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

## 2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරිම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | අවසන් ගිණුම් හා මුල්‍ය ප්‍රකාශන භාෂා තුනෙන්ම සකස් කර ඉදිරිපත් කළ යුතු බව |
| 2 | වත්කම් කළමනාකරණ දත්ත සිගාස් මෘදුකාංගයට ඇතුලත් කිරිම. |
| 3 | වත්කම් ගිණුම්ගත කිරිමේදි නිකුත් කිරිමේ දී නිකුත් කිරිමේ නියෝග වලට අදාල ලැබිම් නියෝග ගෙන්වා ගැනිමට කටයුතු කිරිම |
| 4. | සංචිත වාහන වලට ධාවන සටහන් පොත් විගණනයට ඉදිරිපත් නොවිම. |
| 5. | වාහන අනතුරුවල ප්‍රාරම්භක වාර්තා විගනණයට ඉදිරිපත් නොවිම. |
| 6. | භෞතික භාණ්ඩ පරික්‍ෂාවේදි පාලන අංශයට ලබා දී ඇති ශබ්ද විකාශන යන්ත්‍ර 05 විගණන අවස්ථාවේදි එම නිලධාරින්ට පෙන්විමට කටයුතු නොකිරිම නිසා විගණන ඡේදයක් ලෙස විගණන විමසුමට ඇතුලත් කිරිමට සිදු විම. |
| 7. | භාණ්ඩ සමික්‍ෂණ කටයුතුවලට අදාළ අඩුපාඩු සයන්ස් ලැන්ඩ් ආයතනයෙන් හැකි ඉක්මනින් නිවැරදි කරගැනිමට කටයුතු කිරිම |
| 8. | වෙනත් ආයතන 6 ක් සඳහා ලබා දි ඇති වාහන සඳහා ලැබිම් නියෝග ලබාගෙන නොතිබිම |
| 9 | පළාත් සභා මන්ත්‍රිවරුන්ට සංනිවේදන උපකරණ වැඩිපුර සංඛ්‍යාවක් මිලදි ගැනිම. |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | 2021 නොවැම්බර් මස ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල කිහිපයකම මුදල් පොතේ ශේෂය ඉතා ඉහල අගයක් තිබීම (මතුගම, හොරණ, කළුතර, කොළඹ, වත්තල, බියගම) |
| 2. | වැට් සක්‍රිය බව තහවුරුකර වැට් මුදල් අදාල ආයතනයට ගෙවීම |
| | කොන්ත්‍රාත් පැහැර හරින කොන්ත්‍රාත් කරුවන් අසාධු ලේඛන ගත කිරීම මෙතෙක් සිදුකර නොමැතිබව |
| 3. | ව්‍යාපෘති සඳහා අදාල ලොග් පොත් ගොනුව සමඟ විගණනයට ඉදිරිපත් නොවීම. |
| 4 | නික්තු කිරීමේ නියෝග සඳහා ලැබීම් නියෝග ලබාගත යුත් වීම. |
| 5. | අත්තිකාරම් බැඳුම්කර හා ණය බැඳුම්කර නිසි පරිදි ලබාගත යුතුවීම. |
| 6 | පානදුර ඉංජිනේරු කාර්යාලයේ නිලධාරියකුගේ 2018/2019 වර්ෂ වල වැටුප් රහිත නිවාඩු සඳහා ඉදිරි කටයුතු සිදු කර නොමැති බව. |

**භාණ්ඩාගාර නියෝජිත අධ්‍යකෂ (ගිණුම් හා ගෙවීම ) ගේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | රජයේ නිලධාරින් සඳහා ලබාදෙන තිරුබදු රහිත වාහන බලපත් ඉල්ලුම් කිරීමේදි මීට පෙර ඉල්ලුම් කළ අයඳුම්පත ඉදිරිපත් කළයුතුවීම හා . අදාල අයඳුම්පත පෞද්ගලික ලිපි ගොනුවට අමුණා තැබීම . |
| 2. | රාජකාරි නිවාඩු ලබාදීමේදි නිවාඩුව සනාථ කිරිමට පැමිණිමේ සහතිකය ලබාගත යුතු අතර පාඨමාලාවකට හෝ පුහුණුවකට සහභාගි වුයේ නම් ඒ සඳහා සහභාගිවු බව සනාථ කිරිමට අදාල සහතික පත්‍රය අනිවාර්යෙන්ම ලබාගත යුතු බව. |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පැවැත්වීම ඉතා වැදගත් බවත් විගණනයෙන් ලබාදෙන ලද පැහැදිලි කිරීම් රාජකාරි කටයුතු වලදි යොදා ගැනිම සාර්ථකව රාජකාරි කිරිමට පහසුවක් බවත්, රැස්වීම සඳහා සහභාගි විම සම්බන්ධයෙන් විගණන අධිකාරි, භාණ්ඩාගාර නියෝජිත අධ්‍යකෂ (ගිණුම් හා ගෙවීම ), අභ්‍යන්තර විගණක හා අනෙක්තු සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතිපල කිරිමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 4.00 ට පමණ අවසන් කරන ලදි.

ජී.ඩබ්.පී.පෙරේරා,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
පළාත් ඉංජිනේරු කාර්යාංශය